ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENRAL'S DEPARTMENT

නො. 07, ග්‍රෙගරි මාවත, කොළඹ -07, ශ්‍රී ලංකාව.
இல. 07இ கிரகறிஸ் மாவத்தைஇ கொழும்பு 07, இலங்கை.
No. 07 Gregory's Avenue, Colombo - 07, Sri Lanka.

ෆැක්ස් : / தொலைநகல் : 2684051 / Fax :
ඊ-මේල් : / ஈ-மெயில் : landcom@sltnet.lk / E-mail :

මගේ අංකය : / எனது இலக்கம் / My No : 3/සං/2/බිම්/චක්‍රලේඛ vi
ඔබේ අංකය : / உமது இலக்கம் : / Your No :
දිනය / திகதி / 2009/08/12

රෙජිස්ට්‍රාර් ජනරාල්

**ඉ. සං. ආ. පනතේ 48 වගන්තිය යටතේ නිකුත් කළ දීමනා පත්‍ර (ජීවිත භුක්තිය) සඳහා හිමිකම් සහතිකයක් නිකුත් කිරීම**

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 48 වගන්තිය යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍ර (ජීවිත භුක්තිය) සඳහා හිමිකම් සහතිකයක් නිකුත් කළ යුත්තේ ඉඩමේ උරුමකරු නමින් බවත් එම සහතිකයට ජීවිත භුක්තිකාරියගේ අයිතිවාසිකම් පිළිබඳ කොන්දේසියක් ඇතුළත් කරන ලෙසත් නීතිපති මා වෙත උපදෙස් දී ඇත.

මේ පිළිබඳව බිම්සවි වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රදේශ වල හිමිකම් නිරවුල් කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් වරුන් හා ප්‍රාදේශීය ලේකම් වරුන්ට උපදෙස් ලිපියක් නිකුත් කර ඇත. මේ සම්බන්ධව ඔබගේ නිළධාරීන්ද දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

ඉහත සඳහන් දීමනා පත්‍ර වල උරුම හිමිවන්නේ මියගිය බලපත්‍ර කරු බලපත්‍රයේ නම් කළ පසු උරුමකරු හෝ ඉ.සං.ආ. පනතේ 72 වන වගන්තිය අනුව තෝරා ගන්නා තැනැත්තා වේතය.එම අයට මුල් අයිතිය ලබා දෙනුයේ ජීවිත භුක්තිකාරියගේ ඇවෑමෙන් නිසා මේවන විට එවැනි දීමනාපත්‍ර වල උරුම කරුවන් පිළිබඳ විස්තර ඔබගේ ලේඛන වල ලියාපදිංචි වී නොතිබීමට පිළිවන.

එම නිසා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් උරුමකරුවන් වෙත හිමිකම සහතික කර උපලේඛන ඔබ වෙත එවා ඇති විට ඒවා ලියාපදිංචි කර ගන්නා ලෙස ඔබගේ කාර්යමණ්ඩලයට උපදෙස් ලබාදෙන මෙන්ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

හිමිකම් සහතිකය නිකුත් කිරීමේ දී සහතිකයේ පිටුපස වෙනත් කරුණු තීරයට දීමනා පත්‍රයේ කොන්දේසි 07 ට අතිරේකව ජීවිත භුක්ති කාරියගේ අයිතිවාසිකම් වලට යටත් බවට කොන්දේසියක් පැනවීම අවශ්‍ය බවද කාරුණිකව මතක් කරමි.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :
1. ලේකම් , ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශය - කරු. දැ.ගැ.පි.
2. හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්
3. බිම්සවිය ක්‍රියාත්මක වන ප්‍රදේශ වල පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
4. බිම්සවිය ක්‍රියාත්මක වන ප්‍රදේශ වල සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - අ.ක.ස.
5. රන්බිම ශාඛාව

| | | | | |
|---|---|---|---|---|
| නිර්වාහක / Genral 2677166 | ආයතන / Establishment 2671173 | ගිණුම් / Accounts 2675574 | ඉඩම් / Land 2675576 | සංවර්ධන / Development 2677293 |